# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2017/52 - 2017 මැයි මස 05 වැනි සිකුරාදා - 2017.05.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු
1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා)
පනතේ 3 වන වගන්තිය යටතේ පළ කරනු ලබන නිවේදනය

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදනු ලදුව අංක : 1976/21 හා 2016 ජූලි මස 20 දාතමින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කළ ප්‍රාදේශීය සභා කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා, පහත උපලේඛනයෙහි සඳහන් ආකාරයට 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ විධිවිධාන අනුව 2017 ජනවාරි මස 17 වන දින බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් අනුමත කළ බව මෙයින් නිවේදනය කරමි.

ඉසුර දේවප්‍රිය,
බස්නාහිර පළාතේ, ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා
ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය,
පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික සංවර්ධන,
විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා
ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍ය.

2017 ක් වූ අප්‍රේල් මස 26 වැනි දින,
කොළඹ 07, ශ්‍රාවස්ථි මන්දිරයේ පිහිටි,
බස්නාහිර පළාතේ,
ප්‍රධාන අමාත්‍යාංශයේ දී ය.

### උපලේඛනය

1. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සැරසිලි විධිමත් කිරීම පිළිබඳ (සංශෝධිත) අතුරු ව්‍යවස්ථාව
2. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මාළු විකිණීම පිළිබඳ (සංශෝධිත) අතුරු ව්‍යවස්ථාව
3. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ හෝටල් හා ලැගුම්හල් පිළිබඳ (සංශෝධිත) අතුරු ව්‍යවස්ථාව
4. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මස් විකිණීම පිළිබඳ (සංශෝධිත) අතුරු ව්‍යවස්ථාව

1A - PG 3520 — 11 (2017/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*උපලේඛනය (සම්බන්ධිතයි)*

5. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පීඩාකාරී ව්‍යාපාර, අන්තරායදායක ව්‍යාපාර හා පීඩාකාරී හා අන්තරායදායක ව්‍යාපාර පිළිබඳ (සංශෝධිත) අතුරු ව්‍යවස්ථාව
6. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන පිළිබඳ (සංශෝධිත) අතුරු ව්‍යවස්ථාව
7. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ක්‍රීඩා භූමි පිළිබඳ (සංශෝධිත) අතුරු ව්‍යවස්ථාව
8. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සංචාරක වෙළඳාම පිළිබඳ (සංශෝධිත) අතුරු ව්‍යවස්ථාව
9. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බර සහ වේග සීමා පිළිබඳ (සංශෝධිත) අතුරු ව්‍යවස්ථාව
10. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ භෝජන ශාලා පිළිබඳ (සංශෝධිත) අතුරු ව්‍යවස්ථාව
11. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ (සංශෝධිත) අතුරු ව්‍යවස්ථාව
12. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ බේකරි පිළිබඳ (සංශෝධිත) අතුරු ව්‍යවස්ථාව
13. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ (සංශෝධිත) අතුරු ව්‍යවස්ථාව
14. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ආදාහනාගාර පිළිබඳ (සංශෝධිත) අතුරු ව්‍යවස්ථාව
15. ප්‍රාදේශීය සභා සේවාවන් සඳහා ගාස්තු අය කිරීම පිළිබඳ (සංශෝධිත) අතුරු ව්‍යවස්ථාව

05 - 620

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.